# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**2015 මාර්තු මස 27 වන දින**

**II වන කොටස**

**අතිරේකය**

**(2015.03.30 දින නිකුත් කරන ලදී)**


# ඔට්ටු ඇල්ලීම හා සූදු බදු (සංශෝධන)

**1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

මුදල් අමාත්‍යතුමාගේ නියමය පරිදි පළ කරන ලදී.


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

මිළ : රු. 8.00 යි. තැපැල් ගාස්තුව : රු. 10.00 යි.

## නීතියේ බලපෑම පිළිබඳ ප්‍රකාශය

***2 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු පනතේ 2 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ,

(අ) (1අ) උප වගන්තිය යටතේ ඇති බද්ද සියයට දහය දක්වා වැඩි කිරීම; සහ

(ආ) සූදු ව්‍යාපාරය පවත්වාගෙන යනු ලබන ස්ථානයකට ඇතුල් වන සෑම තැනැත්තකුගෙන් ම අයකරගත යුතු "කැසිනෝ ඇතුල් වීමේ බද්ද' යනුවෙන් හඳුන්වනු ලබන අලුත් බද්දක් හඳුන්වා දීම වේ.

***3 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 2අ වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ 2013 ජනවාරි මස 01 වන දින හෝ ඉන් පසුව එහෙත් 2013 මැයි මස 31 වන දිනට පෙර දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වීම සඳහා විධිවිධාන සැලැස්වීම යි.

***4 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ පිළිවෙළින් 2 වන වගන්තියේ (1) වන උපවගන්තිය සහ (1අ) වන උපවගන්තිය යටතේ ගෙවිය යුතු බදු මුදල් සඳහා මේ වගන්තියේ (5) වන උපවගන්තියේ විධිවිධාන සහ 2010 අංක 10 දරන දේශීය ආදායම් බදු පනතේ ඇතැම් විධිවිධාන අදාළ කර ගැනීම සඳහා විධිවිධාන සැලැස්වීමයි.

***5 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 5(1) වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ එම වගන්තියේ සඳහන් වැරදි සම්බන්ධයෙන් 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන ඇතුළත් කර ගැනීම සඳහා විධිවිධාන සැලැස්වීම යි.

***6 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ "නියෝජ්‍ය කොමසාරිස්වරයකු හෝ තක්සේරුකරුවකු යන වචන වෙනුවට" "නියෝජ්‍ය කොමසාරිස්වරයකු, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස්වරයකු, නියෝජ්‍ය කොමසාරිස්වරයකු හෝ සහකාර කොමසාරිස්වරයකු" යන වචන ආදේශ කිරීමයි.

***7 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට 6අ අලුත් වගන්තියක් ඇතුළත් කරනු ලැබේ. අලුත් වගන්තිය මගින් බලතල සම්බන්ධයෙන් වූ නියෝග සෑදීම සඳහා විධිවිධාන සලස්වනු ලබයි.

***8 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ ආනුෂාංගික සංශෝධන සඳහා විධිවිධාන සැලැස්වීමයි.

***9 වන වගන්තිය :*** මේ වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ 2015 අප්‍රේල් මස 01 වන දින හෝ ඉන් පසුව ආරම්භවන සෑම වර්ෂයක් සඳහා ම බුකීකරුවකුගේ ව්‍යාපාරය සහ සූදු ව්‍යාපාරය සම්බන්ධයෙන් අයකල හැකි බදු මුදල් ප්‍රමාණය උපලේඛනයට ඇතුලත් කිරීමයි.

එල්. ඩී.—ඕ. 12/2015

**1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු පනත සංශෝධනය කිරීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 2015 අංක  දරන ඔට්ටු ඇල්ලීම හා සූදු බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර මේ පනතේ විධිවිධාන සියලු කාර්ය සඳහා 2015 ජනවාරි මස 1 වන දින සිට ක්‍රියාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය. ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.

**2.** 2013 අංක 19 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන)1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු පනතේ 2 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:— 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (1අ) වන උපවගන්තියේ"සියයට පහක අනුපාතය අනුව වූ බද්දක් අයකරගනු ලැබිය යුතු ය" යන වචන වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන්:-

"(අ) 2013 ජනවාරි මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 2015 ජනවාරි මස 1 වන දිනට පෙර ආරම්භ වන සෑම වර්ෂයක් සඳහා ම සියයට පහක අනුපාතයකට අනුව වූ; හෝ

(ආ) 2015 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන සෑම වර්ෂයක් සඳහා ම සියයට දහයක අනුපාතයකට අනුව වූ

බද්දක් අයකරගනු ලැබිය යුතු යඃ"

(2) එම වගන්තියේ (1අ) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:—

"(1අඅ) 2015 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසුව ශ්‍රී ලංකාවේ සූදු ව්‍යාපාරය පවත්වාගෙන යනු ලබන සෑම තැනැත්තෙකු විසින් ම,එම සූදු ව්‍යාපාරය පවත්වා ගෙන යනු ලබන ස්ථානයට ඇතුල්වන සෑම තැනැත්තකුගෙන් ම (මෙහි මින්මතු "කැසිනෝ ඇතුල්වීමේ බද්ද' යනුවෙන් සඳහන් කරනු ලබන") එක්සත් ජනපද ඩොලර් සියයක හෝ පරිවර්තනය කළ හැකි ඊට සමාන වෙනත් ව්‍යවහාර මුදලකින් හෝ ඊට සමාන ශ්‍රී ලංකා රුපියල් වලින් වූ බද්දක් අයකරගනු ලැබිය යුතු යඃ

එසේ වුව ද, (1අඅ) වන උපවගන්තියේ විධිවිධාන—

(අ) එවැනි සූදු ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන ස්ථානයක කළමනාකාර අධ්‍යක්ෂක හෝ කළමනාකාර කමිටුවේ සාමාජිකයෙකු හෝ යම් සේවකයෙකුට;

(ආ) ස්වකීය බලතල, කාර්යය සහ කර්තව්‍යය ඉටුකිරීමේ දී එවැනි ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන ස්ථානයකට ඇතුල් වීමට ඕනෑම ලිඛිත නීතියක් යටතේ බලයලත් නිලධරයෙකුට; හෝ

(ඇ) මෙම පනත යටතේ නියම කරනු ලබන යම් තැනැත්තකුට,

අදාළ නොවිය යුතු ය".

(3) එම වගන්තියේ (1ආ) උප වගන්තියේ:—

(අ) "(1අ) උපවගන්තිය" යන වචන සහ ඉලක්කම් වෙනුවට "(1අ) වන උපවගන්තිය සහ (1අඅ) වන උපවගන්තිය" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ආ) (ආ) ඡේදය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:—

"(ආ) එක් එක් මාසය සම්බන්ධයෙන් වූ (1අ) වන උපවගන්තිය යටතේ සහ 2 වන උපවගන්තියේ (1අඅ) වන උපවගන්තිය යටතේ අයකරගනු ලබන

සහ එකතු කරනු ලබන බදු මුදල එම මාසයට ඉක්බිතිව ම වූ මාසයේ පළමු සතිය අවසාන වීමට පෙරාතුව, ප්‍රේෂණය කරනු ලැබිය යුතු ය.''

(4) එම වගන්තියේ (1ඇ) වන උපවගන්තියේ සඳහන් "(1අ) වන උපවගන්තිය" යන වචන සහ ඉලක්කම් වෙනුවට "(1අ) වන උපවගන්තිය සහ (1අඅ) වන උපවගන්තිය" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 2අ වන වගන්තිය සංශෝධනය කිරීම.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ (2අ) වන වගන්තියේ (1) වන උපවගන්තියේ "2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ" යන වචන වල සිට එම වගන්තියේ අවසානය දක්වා වූ සියලුම වචන සහ ඉලක්කම් වෙනුවට "2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් වන පරිදි 2013 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව එහෙත් 2013 මැයි මස 31 වන දිනට පෙර බුකීකරුවෙකුගේ ව්‍යාපාරය හෝ සූදු ව්‍යාපාරය කරගෙන යනු ලබන සෑම තැනැත්තෙක් ම දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවෙහි ලියාපදිංචි විය යුතු ය." යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ:—

(1) එම වගන්තියේ (5) වන උපවගන්තියේ "මේ පනත යටතේ ගෙවිය යුතු බද්දේ" යන වචන වෙනුවට "මේ පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ගෙවිය යුතු බද්දේ" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එම වගන්තියේ (5) වන උපවගන්තියට පසුව පහත සඳහන් අලුත් උපවගන්තිය එකතු කිරීම මගින්:—

"(6) මේ වගන්තියේ, (5) වන උපවගන්තියේ විධිවිධානවලට අතිරේකව 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ වාර්තා යනාදියට අදාළ XII පරිච්ඡේදයේ 106, 107, 108 සහ 112 වන වගන්තිවල විධිවිධාන, තක්සේරු කිරීම්වලට අදාළ XXII පරිච්ඡේදයේ විධිවිධාන, අභියාචනාවලට අදාළ XXIIIපරිච්ඡේදයේ විධිවිධාන, තක්සේරු කිරීම්වල අවසානාත්මකභාවය සහ වැරදි වාර්තා සම්බන්ධයෙන් වූ දණ්ඩනවලට අදාළ XXIV පරිච්ඡේදයේ

විධිවිධාන, බදු අයකිරීමට අදාල XXVI පරිච්ඡේදයේ විධිවිධාන, පොදු කාරණාවලට අදාල XXXI පරිච්ඡේදයේ විධිවිධාන, වාර්තා, තක්සේරු කිරීම් සහ තක්සේරුකිරීම්වලට එරෙහි අභියාචන භාරදීම සම්බන්ධයෙන්, තක්සේරු කිරීම්වල අවසානාත්මකභාවය සම්බන්ධයෙන් සහ වැරදි සහගත වාර්තා සඳහා වූ දඬුවම්, බදු අයකර ගැනීම සම්බන්ධයෙන් මෙන්ම, මේ පනතේ 2 වන වගන්තියේ (1අ) වන උපවගන්තියේ සඳහන් බදු ගෙවීම සම්බන්ධයෙන් ද අවශ්‍ය වෙනස්කම් සහිතව අදාළ කරගනු ලැබිය යුතු ය.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම උපවගන්තියේ (අ) ඡේදයේ සඳහන් "ව්‍යාපාර පිරිවැටුම් බදු පනතේ 38 වන වගන්තිය" යන වචන සහ ඉලක්කම් වෙනුවට "දේශිය ආදායම් බදු පනතේ 190 වන වගන්තිය'' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) එම උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් "ව්‍යාපාර පිරිවැටුම් බදු පනතේ 42 වන වගන්තිය හෝ 43 වන වගන්තිය" යන වචන සහ ඉලක්කම් වෙනුවට "දේශිය ආදායම් බදු පනතේ 214 වන හෝ 215 වන වගන්ති" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(3) එම උපවගන්තියේ (ඇ) ඡේදයේ සඳහන් "ව්‍යාපාර පිරිවැටුම් බදු පනතේ 57 වන වගන්තිය" යන වචන සහ ඉලක්කම් වෙනුවට "දේශිය ආදායම් බදු පනතේ 209 වන වගන්තිය" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(4) එම උපවගන්තියේ (ඉ) ඡේදයේ සඳහන් "ව්‍යාපාර පිරිවැටුම් බදු පනතේ 57 වන වගන්තිය" යන වචන සහ ඉලක්කම් වෙනුවට "දේශිය ආදායම් බදු පනතේ 209 වන වගන්තිය" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තියේ (2), (3) සහ (4) වන උපවගන්තිවල සඳහන් "නියෝජ්‍ය කොමසාරිස්වරයකු හෝ තක්සේරුකරුවකු" යන වචන යොදා ඇති සෑම තැනකට ම එම වචන වෙනුවට පිළිවෙලින් "කොමසාරිස්වරයකු, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.

කොමසාරිස්වරයකු, නියෝජ්‍ය කොමසාරිස්වරයකු හෝ සහකාර කොමසාරිස්වරයකු" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියට 6අ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය එම ප්‍රඥප්තියේ 6අ වගන්තිය වශයෙන් බලාත්මක විය යුතු යː-

"නියෝග

6අ. (1) නියෝග සෑදිය යුතු යයි මේ පනතින් නියමිත යම් කාරණා සම්බන්ධයෙන් හෝ මේ පනත මගින් නියම කිරීම අවශ්‍ය වන්නා වූ කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු අතර, එසේ පළකරනු ලබන දිනයේ සිට හෝ එහි නිශ්චිතව දක්වා ඇති යම් පසු දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම හැකි පහසු ඉක්මණින් පාර්ලිමේන්තුවේ අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් එම අනනුමතයේ දින සිට, එහෙත් ඒ යටතේ ඊට කලින් කරන ලද කිසිවකට අගතියක් නොමැතිව ම පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සළකනු ලැබිය යුතු ය.

(4) යම් නියෝගයක් (3) වන උපවගන්තිය යටතේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සළකනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු ය."

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තියේ "තක්සේරුකරු" "කොමසාරිස්-ජනරාල්වරයා", "නියෝජ්‍ය කොමසාරිස්වරයා" යන යෙදුම්වල අර්ථ නිරූපනය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපනය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේː-

"කොමසාරිස් ජනරාල්වරයා" සහ "නියෝජ්‍ය කොමසාරිස්"යන යෙදුම්වල ඒවාට පිළිවෙලින් ව්‍යාපාර පිරිවැටුම් බදු පනතේ 59 වන වගන්තියෙන් ඊට දී ඇති අර්ථ ම ඇත්තේ ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය ප්‍රතියෝජනය කිරීම.

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය මෙයින් ඉවත්කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන උපලේඛනය මෙයින් ආදේශ කරනු ලැබේ:-

"උපලේඛනය

**I වන කොටස** (2 වන වගන්තිය)

බුකීකරුවකු ලෙස ව්‍යාපාරය කරගෙන යන තැනැත්තකු විසින් මෙහි I වන තීරුවේ නිශ්චිතව සඳහන් සෑම වර්ෂයක් සඳහා ම ගෙවිය යුතු බදු මුදල් ප්‍රමාණය මෙහි II වන තීරුවේ අනුරූප සටහනේ නිශ්චිතව සඳහන් මුදල හා සමාන මුදලක් විය යුතු ය-

| *I වන තීරුව* *වර්ෂය* | *II වන තීරුව* *බදු මුදල් ප්‍රමාණය* |
|---|---|
| 1. 1988 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 2001 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන සෑම වර්ෂයක් සඳහා ම. | රුපියල් එක්ලක්ෂයක් |
| 2. 2001 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 2002 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන සෑම වර්ෂයක් සඳහා ම. | රුපියල් මිලියන එකක් |
| 3. 2002 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 2005 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන සෑම වර්ෂයක් සඳහා ම— | |
| (i) ව්‍යාපාරය පවත්වාගෙන යාමේදී සජීවී රූපවාහිනී විකාශන පහසුකම් භාවිතා කරන අවස්ථාවක. | රුපියල් තිස්දහසක් |
| (ii) ව්‍යාපාරය පවත්වාගෙන යාමේදී සජීවී රූපවාහිනී විකාශන පහසුකම් භාවිතා නොකරන අවස්ථාවක. | රුපියල් දස දහසක් |
| 4. 2005 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 2006 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන සෑම වර්ෂයක් සඳහා ම බුකීකරුවකුගේ ව්‍යාපාරය— | |

| | |
|---|---|
| (i) අනුයෝජිතයන් මාර්ගයෙන් කරනු ලබන විට. | රුපියල් මිලියන එකක් |
| (ii) සජීවී රූපවාහිනී විකාශන පහසුකම් භාවිතා කර පවත්වාගෙන යනු ලබන අවස්ථාවක. | රුපියල් දෙලක්ෂ පනස් දහසක්. |
| (iii) සජීවී රූපවාහිනී විකාශන පහසුකම් භාවිතා නොකර පවත්වාගෙන යනු ලබන අවස්ථාවක. | රුපියල් විසිපන් දහසක්. |

5. 2006 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 2013 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන සෑම වර්ෂයක් සඳහා ම බුකීකරුවකුගේ ව්‍යාපාරය-

| | |
|---|---|
| (i) අනුයෝජිතයන් මාර්ගයෙන් කරනු ලබන විට. | රුපියල් මිලියන එකක් |
| (ii) සජීවී රූපවාහිනී විකාශන පහසුකම් භාවිතා කර පවත්වාගෙන යනු ලබන අවස්ථාවක. | රුපියල් තුන් ලක්ෂයක් |
| (iii) සජීවී රූපවාහිනී විකාශන පහසුකම් භාවිතා නොකර පවත්වාගෙන යනු ලබන අවස්ථාවක. | රුපියල් පනස් දහසක් |

6. 2013 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 2015 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන සෑම වර්ෂයක් සඳහා ම බුකීකරුවකුගේ ව්‍යාපාරය-

| | |
|---|---|
| (i) අනුයෝජිතයන් මාර්ගයෙන් කරනු ලබන විට. | රුපියල් මිලියන දෙකක් |
| (ii) සජීවී රූපවාහිනී විකාශන පහසුකම් භාවිතා කර පවත්වාගෙන යනු ලබන අවස්ථාවක. | රුපියල් තුන් ලක්ෂයක් |
| (iii) සජීවී රූපවාහිනී විකාශන පහසුකම් භාවිතා නොකර පවත්වාගෙන යනු ලබන අවස්ථාවක. | රුපියල් විසිපන් දහසක් |

7. 2015 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන සෑම වර්ෂයක් සඳහා ම බුකීකරුවකුගේ ව්‍යාපාරය—

| | |
|---|---|
| (i) අනුයෝජිතයන් මාර්ගයෙන් කරනු ලබන විට. | රුපියල් මිලියන හතරක් |

| | |
|---|---|
| (ii) සජීවී රූපවාහිනී විකාශන පහසුකම් භාවිතා කර පවත්වාගෙන යනු ලබන අවස්ථාවක. | රුපියල් හය ලක්ෂයක් |
| (iii) සජීවී රූපවාහිනී විකාශන පහසුකම් භාවිතා නොකර පවත්වාගෙන යනු ලබන අවස්ථාවක. | රුපියල් පනස් දහසක් |

## II වන කොටස

සූදු ව්‍යාපාරයක් කරගෙන යනු ලබන තැනැත්තකු විසින් මෙහි I වන තීරුවේ නිශ්චිතව සඳහන් සෑම වර්ෂයක් සඳහා ම ගෙවිය යුතු බදු මුදල් ප්‍රමාණය මෙහි II වන තීරුවේ අනුරූප සටහනේ නිශ්චිතව සඳහන් මුදල හා සමාන මුදලක් විය යුතු ය.

| *I වන තීරුව*<br>*වර්ෂය* | *II වන තීරුව*<br>*බදු මුදල් ප්‍රමාණය* |
|---|---|
| 1. 1988 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 2001 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන සෑම වර්ෂයක් සඳහා ම. | රුපියල් මිලියන එකක් |
| 2. 2001 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 2002 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන සෑම වර්ෂයක් සඳහා ම, | රුපියල් මිලියන විසි පහක් |
| 3. 2002 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 2005 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන සෑම වර්ෂයක් සඳහා ම— | |
| (i) (රූජිනෝ ක්‍රීඩාව කිරීම හැර) සූදු ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා. | රුපියල් මිලියන දොළහක් |
| (ii) රූජිනෝ ක්‍රීඩාව පමණක් ක්‍රීඩා කිරීමෙන් ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා. | රුපියල් පන්ලක්ෂයක්. |
| 4. 2005 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 2013 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන සෑම වර්ෂයක් සඳහා ම රූජිනෝ ක්‍රීඩාව, ක්‍රීඩා කිරීම ඇතුළු සූදු ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා. | රුපියල් මිලියන පනහක් |
| 5. 2013 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 2015 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන සෑම වර්ෂයක් සඳහා ම රූජිනෝ ක්‍රීඩාව, ක්‍රීඩා කිරීම ඇතුළු සූදු ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා. | රුපියල් මිලියන සියයක් |

| | |
|---|---|
| 6. 2015 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන සෑම වර්ෂයක් සඳහා ම රූජිනෝ ක්‍රීඩාව, ක්‍රීඩා කිරීම ඇතුළු සූදු ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා. | රුපියල් මිලියන දෙසීයක්." |

වලංගු කිරීම.

**10.** 2015 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වී මේ පනත සම්බන්ධයෙන් කථානායකවරයාගේ සහතිකය ඔහුගේ අත්සන ඇතිව සටහන් කරනු ලබන දිනයෙන් අවසන් වන කාලසීමාව තුළ දී ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ බලය දෙනු ලැබූ කොමසාරිස් - ජනරාල්වරයා හෝ යම් තැනැත්තකු විසින් ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තියේ (1අ) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ සහ (1අඅ) වන උපවගන්තිය යටතේ යම් තැනැත්තකුගෙන් අයකර එකතු කරගනු ලැබූ බදු මුදල් සියලු කාර්යයන් සඳහා මේ පනත යටතේ කොමසාරිස් - ජනරාල්වරයා හෝ එම තැනැත්තා විසින් වලංගු ලෙස පනවා එකතු කරගනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය:

එසේ වුව ද, ඉහත කී විධිවිධාන එකී කාලසීමාව තුළ දී අයකරගනු ලැබූ සහ එකතුකරනු ලැබූ එම මුදල් සම්බන්ධයෙන් යම් අධිකරණයක් විසින් නිකුත් කරන ලද යම් තීරණයකට හෝ ආඥාවකට හෝ යම් අධිකරණයක විභාග වෙමින් පවත්නා නීති කෘත්‍යකට බල නොපෑ යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**10.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.